# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,212—1960 ඔක්තෝබර් 14 වැනි සිකුරාදා—14.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය-සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් සංඛ්‍යාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 925 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 921 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ... | 923 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 923 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| වෙනත් පත් කිරීම් ... ... ... | 924 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | 924 | "සුරාබද්ධ ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |



## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

1960 අංක 429

අංකය : ඩී. 1/රෙක් ව/37.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍රයක්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට පහත සඳහන් කරන ලද මහතා යුද්ධ හමුදාවේ නිත්‍ය භට සේනාවේ කපිතාන් කෙනෙකු වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත් කිරීම සහ ඔහු ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට ඇතුලත් කිරීම අනුමත කොට තිබේ :—

දොස්තර මාවතන හේවා මෙත්තානන්ද ද සිල්වා මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 දින,
කොළඹ දී ය.
10—338

1960 අංක 430

අංකය : ඩී. 1/රෙක් ව/41.

### යුධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍රයක්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට, පහත සඳහන් කරන ලද මහතා යුධ හමුදාවේ නිත්‍ය භට සේනාවේ ලෙප්ටිනන්ට් කෙනකු වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත්කිරීම සහ ඔහු ලංකා යුධ හමුදා සංඥා බලකායට ඇතුලත් කිරීම අනුමත කොට තිබේ :—

දොන් සුමති විජේසිරි කුරුප්පු මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹදීය.
10—343

1960 අංක 431

අංකය : ඩී. 1/රෙක් ව/39.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමානන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍රයක්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට පහත සඳහන් කරන ලද මහතා යුද්ධ හමුදාවේ නිත්‍ය භට සේනාවේ ලෙප්ටිනන්ට් කෙනෙකු වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත්කොට ඔහු ලංකා ඉන්ජිනේරු බලකායට ඇතුලත් කිරීම අනුමත කොට තිබේ :—

හාලිහින්ග සිරිල් හෙන්රි පෙරේරා මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 දින,
කොළඹ දී ය.
10—337

1960 අංක 432

අංකය : ඞී. 1/රෙක්ව්/43.

## ශුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍ර

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට පහත සඳහන් කරන ලද මහත්වරුන් යුද්ධ හමුදාවේ නිත්‍ය හට සේනාවේ උප ලෙප්ටිනන්ට් වරුන් වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරවලට පත්කිරීම අනුමත කොට තිබේ:—

දේවගේ එලායස් කත්‍රිආරච්චිගේ දොන් ලයනල් මහතා.

පාදුක්කගේ නිහාල් බ්‍රායන්ට් බෙන්හම් විජේසේන මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 දින,
කොළඹ දීය.
කොළඹ දීය.

10—336

---

1960 අංක 433

අංකය : ඞී. 1/රෙක්ව්/35.

## යුධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ඇතුළත් කිරීමක්

1960 අගෝස්තු මස 11 වැනි දින සිට, උප ලෙප්ටිනන්ට් ජී. තර්මරත්නම් ලංකා සිංහ රෙජිමේන්තුවට ඇතුළත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 සැප්තැම්බර් මස 28 දින,
කොළඹදීය.

10—179

---

1960 අංක 434

අංකය : ඞී/වීඇෆ්/10/ඒ.

## යුධ හමුදාව—ලංකා සෙවච්ඡා හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

(අ) 1960 සැප්තැම්බර් මස 15 වෙනි දින සිට මේජර් කෙනෙකු වශයෙන්—

කපිතාන් පී. ඊ. ගුණවර්ධන, (සී. ඒ. ඇම්. සී.)

(ආ) 1960 සැප්තැම්බර් මස 15 වෙනි දින සිට තාවකාලික මේජර් කෙනෙකු වශයෙන්—

කපිතාන් එල්. වී. ආර්. ප්‍රනාන්දු (සී. ඒ. එම්. සී.)

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹදීය.

10—342

---

1960 අංක 435

අංකය : ඞී/වීඑෆ්/9/ඒ.

## යුධ හමුදාව—ලංකා සෙවච්ඡා හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1960 සැප්තැම්බර් මස 15 වැනි දින සිට, කපිතාන් වශයෙන්—

ලෙප්ටිනන්ට් ජේ. ජී. සමරකෝන්, සී. ඒ. ඇස්. සී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 4 දින,
කොළඹ දීය.

10—291

---

1960 අංක 436

අංකය : ඞී. 42/රෙක්ව්.

## නිලධාරියෙක් පත්කිරීම—රාජකීය ලංකා නාවික හමුදාව

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවෙහි පහත සඳහන් පත්කිරීම අනුමත කර තිබේ:—

1960 සැප්තැම්බර් මස 19 වැනි දින සිට, රාජ්‍යයන් වහන්සේගේ ලංකා සේවයේ නියුක්ත "රන්ගල්ල" නෞකාවේ අණදෙන නිලධාරි තැන වශයෙන්—

ලෙප්ටිනන්ට් කොමාන්ඩර් (පීපී) ඞී. සී. ඉන්ගල්ටන්, රා. ල. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 සැප්තැම්බර් 23 දින,
කොළඹදීය.

10—116

---

1960 අංක 437

අංකය : ඞී. 3/රෙක්ව්/47.

## රාජකීය ලංකා ගුවන් හමුදාව—කොමිෂන් බලපත්‍ර ලත් ධුරවලට පත්කිරීම්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 ඔක්තෝබර් 1 වැනි දින සිට පහත සඳහන් කරන ලද මහත්වරුන් රාජකීය ලංකා ගුවන් හමුදාවේ නියමු නිලධාරීන් වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරවලට පත්කිරීම සහ ඔවුන්ගේ නම්වලට කෙලින් සඳහන් කර තිබෙන ශාඛා වලට ඔවුන් ඇතුළත් කිරීම අනුමත කොට තිබේ:—

සුනිල් ලීලානන්ද ඒකනායක මහතා, ලේඛක

දයා නිහාල් තලගල මහතා, උපකරණ

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹදීය.

10—341.

1960 අංක 438

අංකය : ඩී. 3/රෙක් ට්/43.

## රාජකීය ලංකා ගුවන් හමුදාව—කොමිෂන් බලපත්‍ර ලත් ධූරයකට පත් කිරීමක්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 ඔක්තෝබර් 1 වැනි දින සිට පහත සඳහන් කරන ලද මහතා රාජකීය ලංකා ගුවන් හමුදවේ නියමු නිලධාරියකු වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධූරයකට පත් කිරීම සහ ඔහු එම සේවයේ ගුවන් වාහන පාලක ශාඛාවට ඇතුලත් කිරීම අනුමත කොට තිබේ :—

ඉන්ද්‍රා හේමල් ජයතිලක මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 දින,
කොළඹ දී ය.
10-339

---

1960 අංක 439

අංකය : ඩී. 3/රෙක් ට්/42.

## රාජකීය ලංකා ගුවන් හමුදාව—කොමිෂන් බලපත්‍ර ලත් ධූරයකට පත් කිරීමක්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 ඔක්තෝබර් 1 වැනි දින සිට පහත සඳහන් කරන ලද මහතා රාජකීය ලංකා ගුවන් හමුදාවේ නියමු නිලධාරියකු වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධූරයකට පත් කිරීම සහ ඔහු එම සේවයේ කාර්මික ඉංජිනේරු ශාඛාවට ඇතුලත් . කිරීම අනුමත කොට තිබේ :—

රෙක්ස්වෙල් රාජ්කුමාර් රාමනාදන් මහතා.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. එෆ්. ද එස්. ජයරත්න,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 7 දින,
කොළඹ දී ය.
10-340

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 440

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 53/60.

1960 සැප්තැම්බර් මස 8 වෙනි දින සිට නැවත නියමයක් කරන තුරු නියෝජ්‍ය කෘෂිකම් අධ්‍යක්‍ෂ ඒ. වී. රිචඩ්ස් මහතා කෘෂිකම් අධ්‍යක්‍ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 40/60.

1959 නොවැම්බර් මස 1 වැනි දින සිට සහකාර පොලිස් සුපිරින්ටැන්ඩන්ට් ජේ. ඩබ්ලිව්. ඇල්. ආරිගල මහතා දෙවැණි ශ්‍රේණියේ පොලිස් සුපිරින්ටැන්ඩන්ට් වරයෙකු වශයෙන්.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ 1, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේදීය,
තැ. පෙ. 500.
10-363

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 441

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 11/48.

ඩී. ඊ. විජේයවර්ධන මහතා 1960 ඔක්තෝබර් 3 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 42,970/එම්, 7,410/එල්, 43,011 ඊ එම්, 4,229/ඩී, 7,897/එල් සහ 8,082/එල් නඩුවල තීන්දු දීමට, කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑම්. 2/56.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1960 ඔක්තෝබර් 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, නුවරඑලියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, නුවරඑලියේ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට, නුවරඑලියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධූරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1960 ඔක්තෝබර් 1 වැනි දින සිට 3 වැනි දින දක්වා, 21 වැනි දින සිට 24 වැනි දින දක්වා හා 1960 නොවැම්බර් 29 වැනි දින සිට 1960 දෙසැම්බර් 1 වැනි දින දක්වා, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ ඒඒ. 59/48.

ට්. ආසීර්වාතම් මහතා 1960 ඔක්තෝබර් 8 වැනි දින සිට, රත්නපුර මහෙස්ත්‍රාත් උසාවියේ අංක 73,591 නඩුව ඇසීමට හා තීන්දුව දීමට, රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට, හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඩී. රත්නතුංග මහතා 1960 ඔක්තෝබර් 5 වැනි, 6 වැනි හා 22 වැනි දිනයන්හි, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 58බී/59.

එස්. සෙල්ලයියා හා ඒ. එම්. අමීන් යන මහතුන් නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා 1960 ඔක්තෝබර් 1 වැනි දින සිට 3 වැනි දින දක්වා, කුරුණෑගල, කනදුල්ලේ පිහිටි උසාවියේ (කුලියාපිටියේ නගර සභාව සීමාව තුළ පිහිටි) අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා කුරුණෑගල, කනදුල්ලේ පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට (කුලියාපිටියේ නගර සභාව සීමාව තුළ පිහිටි).

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඩී. රත්නතුංග මහතා 1960 ඔක්තෝබර් 5 වැනි දින, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1960 ඔක්තෝබර් 3 වැනි දින සිට 7 වැනි දින දක්වා ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. පී. විජේතුංග මහතා 1960 ඔක්තෝබර් 7 වැනි දින සිට, මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, මාතර අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 56ඒ/57.

වී. එස්. සලි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1960 ඔක්තෝබර් 17 වැනි දින, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධූරයට, හා මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ. එල්. 71ඒ/51.

පී. ඒ. ද එස්. සේනාරත්න සහ ඩී. විමලරත්න යන මහතුන් නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. බී. පෙරේරා මහතා ඔක්තෝබර් 7 වැනි දින, කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කුරුණෑගල අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 13ඒ/59.

ටී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා 1960 ඔක්තෝබර් 13 වැනි දින සිට 20 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6ඒ/48.

බී. ජී. එස්. ඩේවිඩ් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, කේ. වී. එම්. සුබ්‍රමානියම් මහතා 1960 ඔක්තෝබර් 4 වැනි දින සිට, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/යු. 1/48.

ජී. එම්. උදලාගම මහතා නැති අතර, ටී. එම්. ඒ. සාලෙ මහතා 1960 ඔක්තෝබර් 7 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ දකුණු හා නැගෙනහිර මාතලේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 38/57.

එල්. සේනානායක මහතා 1960 ඔක්තෝබර් 10 වැනි දින, පන්නල ගම්බද උසාවියේ අංක සීආර්එම්. 7,896, 7,909 හා 8,008 නඩු ඇසීමට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ හා දඹදෙණි හත්පත්තුවේ, ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 4/53.

එෆ්. ජේ. ඩී. අබේකෝන් මහතා නැති අතර, ජේ. එස්. පෙරේරා මහතා 1960 ඔක්තෝබර් 5 වැනි දින, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා බස්නාහිර පස්දුන් කෝරලයන්හි හා කළුතර තොටමුනේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 4/48.

ජේ. සිතාරම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. අලගයියා මහතා 1960 ඔක්තෝබර් 11 වැනි දින සිට 13 වැනි දින දක්වා මඩකලපු දිස්ත්‍රික්කයේ ඒරාවූර්, පොරුටිව්, දකුණු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 9/59.

ජේ. පැට්රික් මහතා නැති අතර, එස්. ඒ. සී. එම්. මීරා සයිබෝ මහතා 1960 ඔක්තෝබර් 20 වැනි හා 22 වැනි දිනයන්හි, මඩකලපු දිස්ත්‍රික්කයේ අක්කරෙයි පත්තුවේ හා පනාම පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ඔක්තෝබර් 7 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

10-284

---

## වෙනත් පත් කිරීම්

**1960 අංක 442**

අංක ඒ. ජේ. 10/1/54.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍ය වරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්, ඈම්. ඒ. සී. පෙරේරා මහතා නුවරඑළිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් පත් කර ඇත්තේ ය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1960 සැප්තැම්බර් මස 23 වෙනි දින සිට පී. බී. ජයසූරිය මහතා නැවත වැඩ භාරගන්නාතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම් පත්තු කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ආර්. එම්. චන්ද්‍රසේකර මහතාද,

1960 ඔක්තෝම්බර් මස 1 වෙනි දින සිට එල්. එච්. අන්දිරිස් සිල්වා මහතා නැවත වැඩ භාරගන්නාතුරු බදුල්ල දිස්ත්‍රික්කයේ, ඔයපලාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. ඒ. වනසිංහ මහතාද,

1960 ඔක්තෝම්බර් මස 3 වෙනි දින සිට එල්. පී. ඊ. කරුණාරත්න මහතා නැවත වැඩ භාරගන්නාතුරු කොළඹ දිස්ත්‍රික්කයේ, මීගමු නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට සී. ද කෲස් මහතාද,

1960 ඔක්තෝම්බර් මස 4 වෙනි දින සිට ස්ථිර පත් කිරීමක් කරණතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ බස්නාහිර උඩපොල ඕතොට කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ජේ. සී. වීරකෝන් මහතාද,

1960 ඔක්තෝම්බර් මස 4 වෙනි දින සිට ගාලු දිස්ත්‍රික්කයේ, වැලිහේන, හොරන්ගල්ල සහ අඹන යන විදානාරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයට ජේ. පී. ගුරුසිංහ මහතාද

පත් කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන
ස්ථිර ලේකම්.

1960, ඔක්තෝම්බර් මස 10 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.
10-351.

---

## රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

**1960 අංක 443**

මෙහි පහත සඳහන් පත් කිරීම 1960.10.1 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත.

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු එල්. එච්. පෙරේරා මහතා කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සේවය කරමින් කොළඹ පාලන දිස්ත්‍රික්කයෙහි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්

1960 ඔක්තෝබර් මස 3 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දීය.
10-128

---

**1960 අංක 444**

මෙහි පහත සඳහන් පත් කිරීම 1960.10.1 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත.

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු ආර්. ඒ. ගුණසේකර මහතා කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සේවය කරමින් කළුතර පාලන දිස්ත්‍රික්කයෙහි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා.
රෙජිස්ට්‍රාර් ජනරාල්

1960 ඔක්තෝබර් මස 1 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දීය.
10-213

---

**1960 අංක 445**

මෙහි පහත සඳහන් පත් කිරීම 1960.10.1 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත:—

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු ජී. එම්. ජයතිලක මහතා බදුල්ලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සේවය කරමින් බදුල්ල සහ මොනරාගල පාලන දිස්ත්‍රික්කයන්හි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්

1960 ඔක්තෝබර් මස 1 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දීය.
10-181

# ආණ්ඩුවේ නිවේදන

රා. ආ. වි/අ. අංකය : ඊ/පී. 20/11 (55)

ඇල්.ඩී—බී 32/40

## අපරාධ නඩු විධාන සංග්‍රහය

**2 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

වයඹ පළාතේ අඹන්පොල පිහිටා තිබෙන පොලිස් මුරපොළ, 16 වෙනි පරිච්ඡේදය වන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වන වගන්තිය යටතේ ආණ්ඩුව විසින් පොලිස් ස්ථානයක් ලෙස ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇම්. ඇෆ්. ද ඇස්. ජයරත්න,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 සැප්තැම්බර් මස 30 දින,
කොළඹ.

10-182

---

## 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

**අංක 155 දරණ නියෝගය**

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති තැන්පත් පිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම යාපනේ අර්ධද්වීපයට රතුළූනු කිසියම් ප්‍රමාණයක් රැගෙන යැම හෝ රථවාහන වලින් ගෙන යාම මෙයින් තහනම් කරමි.

මේ නියෝගය සඳහා "යාපනේ අර්ධද්වීපය" නමින් හැඟවෙන්නේ පුනකරී ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයද, කරච්චි-තුනුක්කයි ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශයද, හැර යාපනේ පාලන දිස්ත්‍රික්කයයි.

1960 මැයි 20 වෙනි දින අංක 12,133 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද අංක 148 සහ 1960 මැයි 12 දින දරණ මගේ නියෝගය මෙයින් අවලංගු කරමි.

පී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ ඇමති.

1960 ඔක්තෝබර් මස 4 වෙනි දින,
කොළඹදීය.

10-166

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

**අංක 4—දකුණු කොළඹ මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත්කිරීම සඳහා වූ මැතිවරණය**

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධූරාපේක්ෂකයකු වූ නෙවිල් ඇල්ප්‍රඩ් ද පොන්සේකා ගේ, මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන්ද, 1960 අගෝස්තු 20 දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හයමාසය තුළදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන්ද කායසීල වේලාවන් තුළ ඕනෑම විටකදී කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කායසීලයේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. ඇම්. ඇස්. පෙරේරා,
තේරීම් භාර නිලධාරි තැන,
අංක 4—දකුණු කොළඹ මැතිවරණ
කොට්ඨාශය.

1960 ඔක්තෝබර් මස 3 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
කොළඹ.

10-122

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.